## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2010

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

ඉදිරිපත් කරන ලද ගිණුම් සඳහා පාලක සභා අනුමැතිය ඉදිරිපත් නොවුණ අතර එම ගිණුම් ගණකාධිකාරී විසින් අත්සන් කර නොතිබුණි.

1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

(අ) ප්‍රමිත අංක 24

2008 අප්‍රේල් 17 දින භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද රු.1,800,000 වාහනයේ වටිනාකම හා රු.1,165,700 ක් වටිනා වත්කම් රජයේ ප්‍රදාන (ප්‍රාග්ධන) ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ආ) ප්‍රමිත අංක 03

පූර්ව වර්ෂවල වැරදියට අනුගමනය කල ගිණුම් ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදලට හර කරන ලද රු. 1,717,181 ක් හා ක්ෂය වෙන් කිරීම් රු. 813,402 ක් හා ගොඩනැගිලි කාමර වෙන් කිරීම් රු. 903,779 ක් බැර කිරීම් පිළිබඳව සිදුවූ ප්‍රතිපත්ති වෙනස්වීම ගිණුම් ප්‍රතිපත්ති 03 ප්‍රකාර සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(1) සමාලෝචිත වර්ෂයේ වැඩිහිටි නිවාස අලුත් වැඩියාව සඳහා මීගස්තැන්න වැඩිහිටි නිවාසයට හා බලංගොඩ ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයට ලබාදුන් මුදලින් ඉතිරි වූ රු.259,764 ක් නැවත ප්‍රේෂණය කර නොතිබුණු හෙයින් මූල්‍ය ප්‍රකාශනවල එම ආයතනවලින් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත නොකර පුනරුත්ථාපන හා නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(2) රු.318,490 ක් වටිනා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලී බඩු හා කාර්යාල උපකරණ යටතේ ද, රු.26,887 ක් වටිනා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය පිරියත හා යන්ත්‍ර යටතේ ද ගිණුම් ගත කර තිබුණි.

1.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 3 වගන්තිය. | සභාවේ සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණය ක්‍රමවත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතඵලය රු. 948,294 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 16,161,187 ක් විය. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු.17,109,481 ක වර්ධනයක් වී තිබුණි. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු. 17,759,000 ක් ද විවිධ ආදායම් රු. 274,758 කින වැඩි වීමද ගිවිසුම්ගත සේවා රු. 467,537 ක් ද වෙනත් මෙහෙයුම් වියදම් රු. 4,139,513 කින් අඩුවීමද හේතු වී තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය
--------------------------

2.2.1 කාර්ය සාධනය
-------------------

2010 වර්ෂය තුලදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසන් ක්‍රියාකාර් සැලැස්ම අනුව ඉටුකිරීමට බලාපොරොත්තු වූ වැඩිහිටි කමිටු පිහිටුවීම, දිවා මධ්‍යස්ථාන සඳහා මූල්‍යාධාර සැපයීම, පුහුණු වැඩ සටහන් පැවැත්වීම, වෛද්‍ය සායන අක්ෂි කාච හා ආධාර උපකරණ ලබාදීම, ශ්‍රවනාධාර උපකරණ ලබාදීම ආදි කාර්යයන් පහක් සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්ක සපරා නොතිබුණි.

2.2.2 අභ්‍යන්තර විගණනය

------------------------

අදාල අමාත්‍යාංශයේ අනුයුක්ත අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

2.2.3 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේදි ඇස්තමේතුගත හා තථ්‍ය වියදම් අතර 8% සිට 100% දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගබඩා පාලනය.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරම හා ඉදිරිපත් කිරීම.

(ඇ) අයවැය ගත පාලනය.

(ඈ) ස්ථාවර වත්කම්.